

# දකුණු පළාත් සභාව
## தென் மாகாண சபை
## SOUTHERN PROVINCIAL COUNCIL

### අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
கல்வி, காணி மற்றும் காணி அபிவிருத்தி, லைகவ் மற்றும் தகவல்நெடுஞ்சா நுறை அமைச்சு

**Ministry of Education, Land & Land Development, Highways & Information**

**බිම් මහල, "දක්ෂිණ පාය", ලබුදුව, ගාල්ල.** கீழ் மாடி, "தக்ஷின பாய", லபுதுவ, காலி. Ground Floor, "Dakshina Paya", Labuduwa, Galle.

| මගේ අංකය / எனது இல / **My No.** | SP/Edumin/Ad/13/An/2026 | ඔබේ අංකය / உனது இல / **Your No.** | | දිනය / திகதி / **Date** | 2026.06. 01 |
|---|---|---|---|---|---|

දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,

<u>දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු අනධ්‍යයන සේවක සේවයේ වාර්ෂික ස්ථාන මාරු-2026</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2026.05.18 දින අනුමැතිය ලබා දී ඇති අංක 01/2026 දරණ අභ්‍යන්තර චක්‍රලේඛයේ පිටපතක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

02. දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන අනධ්‍යයන සේවකයින්ගේ වාර්ෂික ස්ථානමාරු පිළිබඳ විධිවිධාන එකී චක්‍රලේඛය මඟින් දක්වා ඇති අතර මෙම වාර්ෂික ස්ථානමාරු 2026.08.15 දින සිට බලපැවැත්වෙන සේ ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

03. එබැවින් මෙම ස්ථානමාරු චක්‍රලේඛය පිළිබඳ සියලු විදුහල්පතිවරුන් හා අනධ්‍යයන සේවකයන් දැනුවත් කර අදාළ ස්ථානමාරු අයදුම්පත්‍ර ඔබගේ නිර්දේශ ද සහිතව 2026.06.23 දිනට ප්‍රථම මා වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

04. එසේම අදාල චක්‍රලේඛයේ 3.9 හි උපදෙස් දී ඇති පරිදි කිසියම් සේවා ස්ථානයක වසර 05 ක් හෝ ඊට වඩා වැඩි කාලයක් සේවය කර ඇති නමුත් , ස්ථාන මාරු අයදුම්පත්‍ර යොමු කර නොමැති නිලධාරීන්ගේ විස්තර මේ සමඟ අමුණා ඇති ඇමුණුම 02 ප්‍රකාරව මා වෙත ඉදිරිපත් කළ යුතු අතර වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර යොමු කර ඇති නිලධාරීන්ගේ විස්තර ඇමුණුම 03 ප්‍රකාරව මා වෙත යොමු කළ යුතු බව සඳහන් කරමි.තවද අංක 02 සහ අංක 03 ඇමිණුම්වල මෘදු පිටපත් <u>speducadre@gmail.com</u> වෙත 2026.06.23 දිනට පෙර යොමු කල යුතුය.

05. ස්ථාන මාරු ක්‍රියාවලියට අදාල කාල රාමුව පහතින් දක්වා ඇති අතර එකී කාල රාමුවට අනුකූල වන ලෙස සියලු ස්ථානමාරු කටයුතු සිදු කළ යුතු බැවින් මේ පිළිබඳ ඔබගේ පෞද්ගලික අවධානය යොමු කර අදාල සියලු තොරතුරු හා අයදුම්පත්‍ර නියමිත දිනට මා වෙත යොමු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

| දිනය | කාරණය |
|---|---|
| 2026.06.01 | වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීම. |
| 2026.06.15 | කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ස්ථාන මාරු අයදුම්පත් ලැබිය යුතු අවසන් දිනය |
| 2026.06.20 | දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු අයදුම්පත් ලැබිය යුතු අවසන් දිනය |
| 2026.06.23 | දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනය |
| 2026.07.13 | ස්ථාන මාරු මණ්ඩල තීරණ දැනුම් දීම. |
| 2026.07.27 | අභියාචනා ඉදිරිපත් කල යුතු අවසන් දිනය |
| 2026.08.07 | අභියාචනා තීරණ දැනුම් දීම |
| 2026.08.15 | ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම |
| 2026.09.01 | ස්ථාන මාරු පිළිබඳ පසුවිපරම් වාර්තාව කලාප මට්ටමින් ලබා ගැනීම |

එන්.කේ.ආර්. පතිරණ
ලේකම්
අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන,
මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
දකුණු පළාත.

එන්.කේ.ආර්.පතිරණ,
ලේකම්

ලේකම් 091-2246156 | කාර්යාලය 091-2030708 පාලන/நிர்வாகம்/Administration | 091-2030703 සැලසුම්/திட்டமிடல்/Planning | ෆැක්ස් 091-2246157

අභ්‍යන්තර චක්‍රලේඛ 01/2026

මගේ අංකය : SP/Edumin/AD/13/AN/2026
දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
දක්ෂිණපාය,
ලබුදූව.
2026.06.01

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
ගාල්ල/උඩුගම/ඇල්පිටිය/අම්බලන්ගොඩ,
මාතර/මුලටියන/අකුරැස්ස/දෙනියාය,
වලස්මුල්ල/තංගල්ල/හම්බන්තොට.

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු අනධ්‍යයන සේවක සේවයේ වාර්ෂික ස්ථාන මාරු.**

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු අනධ්‍යයන සේවක සේවයේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට අදාළවයි.

1. දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් පහත සඳහන් තනතුරුවල වාර්ෂික ස්ථාන මාරු 2026 වර්ෂයේ අගෝස්තු 15 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇති අතර, එහිදී සේවකයින්ට මෙන්ම රාජ්‍ය සේවයටද ඇතිවන අපහසුතා මඟ හැරවීම පිණිස පහත සඳහන් ආකාරයට ස්ථාන මාරු පිළිබඳ ක්‍රියා මාර්ග අනුගමනය කරනු ලැබේ.

2. දකුණු පළාත් අධ්‍යාපන ලේකම් පත්වීම් බලධරයා වන පහත සඳහන් තනතුරුවල සේවයේ නියුක්ත සේවකයින් මෙම ස්ථාන මාරු චක්‍රලේඛයට යටත් වේ.
   - 2.1. පාසල් කම්කරු
   - 2.2. පාසල් මුරකරු
   - 2.3. රසායනාගාර සේවක
   - 2.4. පුස්තකාල සේවක
   - 2.5. පාසල් කාර්ය සහායක

3. ස්ථාන මාරු සඳහා සේවකයන්ගේ සුදුසුකම් ආදිය ගැන තීරණ ගැනීමේදී පහත සඳහන් ප්‍රතිපත්ති පොදුවේ උපයෝගී කර ගනී.

   3.1. අදාළ වර්ෂයේ ජුනි 30 වන දිනට :-

   (අ) කිසියම් සේවා ස්ථානයක අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් ස්ථාන මාරුවීම් ඉල්ලා සිටීම සඳහා සුදුසුකම් ලබයි. ඒ අනුව එම නිලධාරීන් අයදුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

   (ආ) අදාළ සේවා කාලය සැලකීමේ දී නිලධාරියාගේ ඉල්ලීම මත ලබා ගෙන ඇති අනුයුක්ත සේවා කාලයත්, වැටුප් රහිතව විදේශගතව සිටි කාලයත් සලකා බලනු නොලැබේ.

   (ඇ) ස්ථාන මාරු සඳහා ඉදිරිපත් වන සියලු අයදුම්පත් සලකා බැලීම හා ස්ථාන මාරු සඳහා සේවා කාලය සම්පූර්ණ කර ඇති සියලුම නිලධාරින්ගේ තොරතුරු ස්ථාන මාරු මණ්ඩලය මඟින් සලකා බැලීම සිදු කරන නමුත්, එම සියලු නිලධාරින් සඳහා ස්ථාන මාරු නියෝග ලබා දෙන බව ඉන් අදහස් නොවේ.

3.2. 3.1 (අ) ඡේදය යටතට ගැනෙන නිලධාරියෙකු වෙනත් ස්ථානයකට මාරු වීමට ඉල්ලා ඇති විටෙක එම ඉල්ලීම ඉටු කිරීම සඳහා 3.1 (ආ) ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති හා අයදුම්කොට ඇති ඒකකයේ වැඩිම සේවා කාලයක් සහිත සේවකයා ඉන් පිටතට මාරු කරනු ඇත.

3.3. (අ) සුවිශේෂී හේතු ඇති විට කිසියම් සේවා ස්ථානයක වසර දෙකක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට ද වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීමට හැකියාව ඇත.

(ආ) පවතින සේවක අතිරික්තය හා ඉල්ලීම සැලකිල්ලට ගෙන මාතර කලාප අධ්‍යාපන කාර්යාලය හා මුලටියන (හක්මණ) කලාප අධ්‍යාපන කාර්යාලය යන කලාප ජනප්‍රිය සේවා ස්ථාන ලෙස නම් කරනු ලබන අතර, මෙම කලාප තුළ වසර 05 ක සේවා කාලයක් සපුරා තිබීම, එම කලාපවලින් ඉවතට ස්ථාන මාරු කිරීම සඳහා ප්‍රමාණවත් සේවා කාලයක් ලෙස සලකනු ලැබේ.

3.4. භාර්යාව හා ස්වාමි පුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත අය නම් එම දෙදෙනාටම ඔවුන්ගේ ඉල්ලීම අනුව එකම ප්‍රදේශයක සේවය කරන්නට ඉඩ ලබා දීමට මාරු මණ්ඩලය සෑම උත්සහායක්ම දරනු ඇත.

3.5. වයස අවුරුදු 55ක් ඉක්ම වූ සේවකයන් දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතු වුවත්, දිස්ත්‍රික්කය ඇතුළත ස්ථාන මාරු කිරීම්වලට යටත් වන්නේය. එහෙත් සේවකයාගේ ඉල්ලීම හෝ වෙනත් විශේෂිත කරුණු සැලකිල්ලට ගෙන දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු කිරීමට සලකා බලනු ඇත.

3.6. යම් සේවා ස්ථානයක ස්ථාන මාරු වීම් ලැබීමට සුදුසුකම් ලබන බහුතරයක් සිටී නම්, එම සේවා ස්ථානයේ කාර්යයන්ට හානියක් නොවන පරිදි ස්ථාන මාරු විම් සිදු කිරීම සඳහා ස්ථාන මාරු කමිටු හැකි සෑම ආකාරයකින්ම ක්‍රියාකරනු ඇත.

3.7. අදාළ වාර්ෂික ස්ථාන මාරු කමිටු සහ සමාලෝචන කමිටු සඳහා කම්කරු දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි වී ඇති හා ආසන්න පූර්ව වර්ෂ 02 ක් සඳහා කම්කරු දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචිය යාවත්කාලීන කරන ලද, පිළිගත් වෘත්තීය සමිති නියෝජිතයන් සඳහා කැඳවීම සිදු කරනු ලැබේ. සෑම වර්ෂයකම ජුනි 30 දිනට ඉහත 02 යටතට ගැනෙන සේවාවන්ට අයත් දකුණු පළාතේ අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත වෘත්තීය සමිති පමණක් වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයට සහභාගී කරවා ගනු ඇත.

3.8. දකුණු පළාත් අධ්‍යාපන ලේකම් විසින් පිළිගත් ප්‍රස්තුත සේවයේ වෘත්තීය සමිතියක, මව් සංගමයේ ප්‍රධාන නිලතල උසුලන නිලධරයන් ස්ථාන මාරු කිරීම/නොකිරීම සම්බන්ධව අනුග්‍රහ ලබා ගැනීමට අපේක්ෂා කරන සියලුම වෘත්තීය සමිති එම අනුග්‍රහය ලබා දිය යුතු තම වෘත්තිය සමිති නිලධාරීන් පිළිබඳ විස්තර ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7:5 වගන්තියේ ප්‍රකාර අදාළ මාරුවීම් බලධාරියා වෙත මාරුවීම් මණ්ඩල කටයුතු ආරම්භ කිරීමට පෙර ඉදිරිපත් කළ යුතු වේ.

3.9. ඉහත 3.1 (අ) හි සඳහන් පරිදි කිසියම් සේවා ස්ථානයක වසර 5ක සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන් ඇමුණුම අංක 01 හි ඇතුළත් අයදුම්පත සම්පූර්ණ කර ආයතන ප්‍රධානියාගේ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය හා නිල මුද්‍රාව සහිතව ඉදිරිපත් කළ යුතුය. උක්ත අයදුම් පත්‍රයෙහි 24 යටතේ සඳහන් කළයුතු අපේක්ෂිත සේවා ස්ථාන, ස්ථාන මාරු ඉල්ලුම් කරනු ලබන සේවකයින්ගේ මනාපයට අනුව වන බවට ඔහු/ඇය විසින්ම 26 වන තීරුවෙහි තම අත්සන යොදා තිබිය යුතුය. ඉහත උපදෙස් දී ඇති පරිදි, <u>අදාළ සියලුම සේවකයින්ගේ තොරතුරු මා වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වේ.</u>

3.10. සෑම සේවකයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන ප්‍රධානීන් / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වගබලා ගත යුතුය. සාවද්‍ය, අසම්පූර්ණ තොරතුරු ඇති බව හෙළිවුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන ප්‍රධානීන් / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා එම ලැයිස්තු සකස් කළ හා පරීක්ෂා කළ නිලධාරීන් වගකීමට බැඳී සිටින අතර ඔවුන් විනයානුකූල ක්‍රියාමාර්ගවලට ද යටත් වේ.

3.11. වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය සඳහා සහභාගී වන සියලුම නිලධාරීන් හා වෘත්තීය සමිති නියෝජිතයන් විසින් රහස්‍යභාවය සුරකින බවට ලිඛිත ප්‍රකාශයක් ලබා දිය යුතු අතර, රහස්‍ය භාවය සුරැකීමට කටයුතු නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගත හැකිය.

3.12. වාර්ෂික ස්ථාන මාරු කමිටු තීරණ ලබා ගැනීමේ දී, ස්ථාන මාරු විෂය නිලධාරීන්ගේ ගොනුගත කරුණු විමසා බැලීමේ හැකියාව අදාළ ස්ථානමාරු කමිටුවේ සභාපති හට පවතී.

3.13. පහත තනතුරුවලින් සෑදුම්ලත් වාර්ෂික ස්ථානමාරු කමිටුවක් පත්කිරීමට පළාත් අධ්‍යාපන ලේකම් විසින් කටයුතු කරනු ඇත.

- දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සභාපති)
- දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන)
- අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ(පාලන)
- නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) - කලාප අධ්‍යාපන කාර්යාල
- සුදුසුකම් ලත් වෘත්තීය සමිති නියෝජිතයන් එක් අයෙකු බැගින්

4. අභියාචනා මණ්ඩලය

4.1 ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා අභියාචනා සමාලෝචන කමිටු විසින් පහත සඳහන් කරුණු පිළිබඳ පරීක්ෂා කර තීරණ ගනු ඇත.

- මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්.
- ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනයෙන් පසුව සේවකයින්ට සිදු වූ හදිසි විපත්, කරදර, අසනීප වැනි සානුකම්පිත තත්ත්වයන් සම්බන්ධයෙන් පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කර ඇත්නම් ඒවා පිළිබඳව.
- වාර්ෂික ස්ථාන මාරු සඳහා නම් කළ නිලධාරියෙකු තව දුරටත් තම ආයතනයේ රඳවා ගැනීමට ස්ථානමාරු ලාභියාගේ ද එකඟතාවය සහිතව සිදු කරන හේතු සහගත නිර්දේශ.

4.2 ස්ථාන මාරු අභියාචනා සලකා බැලීම සඳහා පහත නිලධාරීන්ගෙන් සෑදුම්ලත් කමිටුවක් මඟින් සිදු කරනු ලබයි.

- දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සභාපති)
- දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන)
- පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
- පරිපාලන නිලධාරී - අධ්‍යාපන අමාත්‍යාංශය
- සුදුසුකම් ලත් වෘත්තීය සමිති නියෝජිතයන් එක් අයෙකු බැගින් නිරීක්ෂණ මට්ටමින් සහභාගී විය හැකිය.

5. විශේෂ තත්වයන් යටතේ හැර වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක වන කාල සීමාව තුළ අතර කාලයේදී පාසල් අනධ්‍යයන සේවක සේවයට අදාළ සුහද ස්ථාන මාරුවීම් ඇතුළු අනෙකුත් ස්ථාන මාරුවීම් සිදුනොකළ යුතුය.

6. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලූ ම සේවකයින්, නියමිත දිනයේ නව රාජකාරී ස්ථානය වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැඳී ඇත.

7. මාරු මණ්ඩල මගින් ස්ථාන මාරුවීම් ලබා දී ඇති සේවකයින් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකි වන සේ මුදා හැරීමට සෑම ආයතන ප්‍රධානියෙකුම කටයුතු කළ යුතුය.

8. ස්ථාන මාරුවීම් අනුව අනුප්‍රාප්තිකයින් නියමිත දින සිට නව සේවා ස්ථානයේ රාජකාරී කටයුතු වලට වාර්තා කර තිබියදීත් ඇතැම් ආයතන ප්‍රධානීන් විසින් අදාළ සේවකයන් මුදාහැර නොමැති අවස්ථා වාර්තා වී ඇත. එවැනි අවස්ථා උද්ගත නොවීමට ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

9. යම් හෙයකින් වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කරන දිනය දීර්ඝ වන්නේ නම්, වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ දින සිට ඒ වන විටත් ගෙන ඇති වාර්ෂික ස්ථාන මාරු තීරණයන්ට අගතියක් නොවන පරිදි සුහද ස්ථාන මාරු වීම් ඇතුළුව අනෙකුත් ස්ථාන මාරු වීම් ලබා දීමට කටයුතු කළ හැකිය.

10. මෙම ස්ථානමාරු සම්බන්ධව සෑහිමකට පත්නොවන අවස්ථාවක දී දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දින 14 ක් තුල අභියාචනා කිරීමට ස්ථානමාරුලාභීන්ට මෙන්ම ස්ථාන මාරු අපේක්ෂා කරන නිලධාරීන්ට ද හැකියාව පවතී.

11. මෙම චක්‍රලේඛය අදාළ සියලූ නිලධාරින් දුටු බවට තහවුරු කර ගැනීමට කටයුතු කරන මෙන් දන්වමි.

එන්.කේ.ආර් පතිරණ,

ලේකම්.

එන්.කේ.ආර්. පතිරණ
ලේකම්
අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන,
මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
දකුණු පළාත.

ඇමුණුම් අංක 01

## වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

| දිනය | කාරණය |
|---|---|
| 2026.06.01 | වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීම. |
| 2026.06.20 | කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ස්ථාන මාරු අයදුම්පත් ලැබිය යුතු අවසන් දිනය |
| 2026.06.25 | දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු අයදුම්පත් ලැබිය යුතු අවසන් දිනය |
| 2026.06.30 | දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනය |
| 2026.07.25 | ස්ථාන මාරු මණ්ඩල තීරණ දැනුම් දීම. |
| 2026.08.07 | අභියාචනා ඉදිරිපත් කල යුතු අවසන් දිනය |
| 2026.08.17 | අභියාචනා තීරණ දැනුම් දීම |
| 2026.09.01 | ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම |
| 2026.09.15 | ස්ථාන මාරු පිළිබඳ පසුවිපරම් වාර්තාව කලාප මට්ටමින් ලබා ගැනීම |

ඇමුණුම් අංක 01

# වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රය

සැ.යු. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය අවු:05 හෝ ඊට වැඩි සියළුම සේවකයින් මෙම අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ. (ඔබගේ තනතුර ඉදිරියෙන් ✓ ලකුණ යොදන්න)

| | | |
|---|---|---|
| තනතුර | රසායනාගාර සේවක | |
| | පුස්තකාල සේවක | |
| | පාසල් කම්කරු | |
| | පාසල් කාර්ය සහායක | |
| | මුරකරු | |

| | | | |
|---|---|---|---|
| අ.) පෞද්ගලික තොරතුරු | | | |
| 01. සම්පූර්ණ නම | | | |
| 02. මුලකුරු සමග නම | | | |
| 03. උපන් දිනය | | 04. ජා.හැ.ප.අංකය | |
| 05. ......./12/31ට වයස | | 06. ස්ත්‍රී/පුරුෂ භාවය | |
| 07. i. ස්ථිර ලිපිනය | | 08. දුරකථන අංකය | කාර්යාලය: |
| ii. තාවකාලික ලිපිනය | | | පෞද්ගලික: |
| 09. විවාහක/අවිවාහක බව | 10. කලත්‍රයාගේ නම | 11.කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය<br>*කලත්‍රයා විදේශගතව සිටීද:<br>12.පදිංචි ස්ථානයේ සිට සේවා ස්ථානයට දුර :- කි.මී. | |
| 13. දරුවන් ගණන (ආබාධිත නොවන) | 14. ඔවුන්ගේ වයස | 15. ඉගෙනුම ලබන්නේ නම් පාසල් | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| 16. දරුවන් ගණන (ආබාධිත ) | ඔවුන්ගේ වයස | ඉගෙනුම ලබන්නේ නම් පාසල් | |
| | | | |
| | | | |
| | | | |

ආ.) සේවා තොරතුරු

| | |
|---|---|
| 17. වර්තමාන සේවා ස්ථානය : | 18. සේවා ස්ථානය පිහිටි කලාපය: |
| 19. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කල දිනය :<br>20. පදිංචි ස්ථානයේ සිට වර්තමාන සේවා ස්ථානයට දුර ප්‍රමාණය :- කි.මී......... මීටර්............ | 21. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය :<br>අවු.........මාස.........දින.......... |

| 22. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | සේවා ස්ථානය | සේවා කාලය | | |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | කාලය |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

| 23. ආසන්න වසරක කාලයකදී වෙනත් සේවා ස්ථානයකට හෝ ස්ථාන කිහිපයකට අනුයුක්තව සේවය කර ඇත්නම් එම සේවා ස්ථාන | අනුයුක්ත සේවා ස්ථානය | අනුයුක්ත කාලය | | |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | කාලය |
| | | | | |
| | | | | |
| | | | | |

ඇ.) ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (තම කැමැත්තේ අනුපිළිවෙළට සේවා ස්ථාන 03ක් නම් කරන්න)

| 24. | සේවා ස්ථානය | පිහිටි නගරය | පදිංචි ස්ථානයේ සිට දුර :- කි.මී./මීටර් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

25. ස්ථාන මාරු ඉල්ලුම් නොකිරීමට විශේෂ හේතු: (සේවකයා හෝ යැපෙන්නන් යම් ආබාධිත තත්වයකින්/රෝගාබාධයකින් පෙළෙන්නේ නම් ඒ බවට වෛද්‍ය සහතිකවලින් කහවුරු කිරීමට යටත්ව මෙහි සඳහන් කරන්න. වාර්ශික ස්ථාන මාරු ක්‍රියාත්මක වන කාලය තුල ප්‍රසූත නිවාඩු යාමට නියමිතව ඇති නම් ඒ බව සඳහන් කරන්න)

26. ඉහත දක්වා ඇති සියල්ල තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, අසත්‍ය තොරතුරු වාර්තා කිරීමෙන් මට විරුද්ධව විනයානුකුලව කටයුතු කිරීමට හැකි බව දන්නා බවටත් සහතික වෙමි.

| | |
|---|---|
| ................................<br>දිනය | ..................................<br>අත්සන |

27. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය:-

i. ස්ථාන මාරු මණ්ඩලය වෙත දැනුම් දිය යුතු විශේෂ කරුණු( තිබේ නම් පමණක්):-

......................................................................................................................

ii. සේවකයාගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු (සහිතව/රහිතව) නිර්දේශ කරමි/නිර්දේශ නොකරමි.

iii. නිර්දේශ නොකරන්නේ නම් හේතු : -

......................................................................................................................

......................................................................................................................

| | |
|---|---|
| ..................................<br>දිනය | ..................................<br>ආයතන ප්‍රධානියාගේ<br>අත්සන හා නිල මුද්‍රාව |

28. දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

i. සේවකයා විසින් අනු අංක 01 සිට 23 දක්වා සම්පූර්ණ කර ඇති තොරතුරු ඔහුගේ /ඇයගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව නිවැරදි බවට සහතික කරමි.

| | |
|---|---|
| ..................................<br>දිනය | ..................................................<br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ<br>අත්සන හා නිල මුද්‍රාව |

29. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

ii. මෙම සේවකයාගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු (සහිතව/රහිතව) නිර්දේශ කරමි/නිර්දේශ නොකරමි.

| | |
|---|---|
| ..................................<br>දිනය | ..................................................<br>පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ<br>අත්සන හා නිල මුද්‍රාව |

ඇමුණුම 02

## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු අනධ්‍යයන සේවක සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2026

## වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් නොකළ නිලධාරීන්ගේ තොරතුරු ලේඛනය

තනතුර-

<table>
<tr><th rowspan="3"></th><th rowspan="3">අනු අංකය</th><th rowspan="3">නිලධාරියාගේ නම</th><th rowspan="3">මුල් පත්වීම් දිනය</th><th rowspan="3">ජා.හැ.අං.</th><th rowspan="3">2026.06.30 දිනට වයස</th><th rowspan="3">ස්ථිර පදිංචි ලිපිනය</th><th rowspan="3">තාවකාලික පදිංචි ලිපිනය</th><th rowspan="3">වර්තමාන නිත්‍ය සේවා ස්ථානය හා පදිංචි ලිපිනයේ සිට දුර</th><th rowspan="3">වර්තමාන නිත්‍ය සේවා ස්ථානයේ සේවා කාලය ( 2026.06.30 දිනට) - අනුයුක්ත කාල සීමා ඇත්නම් එම කාල සීමා හැර</th><th rowspan="3">විවාහක/ අවිවාහක බව</th><th rowspan="3">කලත්‍රයාගේ රැකියාව(රජයේ/ පෞද්ගලික/විදේශ/රැකියා නැති)</th><th colspan="2">දරුවන් පිළිබඳ වස්තර(ආබාධිත නොවන)</th><th colspan="2">දරුවන් පිළිබඳ වස්තර(ආබාධිත )</th><th rowspan="3">නිලධාරියා හෝ යැපෙන්නන් යම් රෝගාබාධයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර</th><th colspan="4">ආසන්නතම කාල සීමාව තුළ පූර්ව සේවා ස්ථාන 02</th><th colspan="3">නිලධාරියා ඉල්ලුම් කර ඇති පාසල් හා පදිංචි ස්ථානයේ සිට ඇති දුර</th></tr>
<tr><th rowspan="2">වයස</th><th rowspan="2">ඉගෙනුම ලබන්නේ නම් පාසල</th><th rowspan="2">වයස</th><th rowspan="2">ඉගෙනුම ලබන්නේ නම් පාසල</th><th colspan="2">1</th><th colspan="2">2</th><th rowspan="2">පාසල 01 හා දුර</th><th rowspan="2">පාසල 02 හා දුර</th><th rowspan="2">පාසල 03 හා දුර</th></tr>
<tr><th>සේවා ස්ථානය</th><th>කාල සීමාව</th><th>සේවා ස්ථානය</th><th>කාල සීමාව</th></tr>
<tr><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
</table>

ඇමුණුම 03

## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු අනධ්‍යයන සේවක සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2026

## වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ නිලධාරීන්ගේ තොරතුරු ලේඛනය

තනතුර-

| | අනු අංකය | නිලධාරියාගේ නම | මුල් පත්වීම් දිනය | ජා.හැ.අං. | 2026.06.30 දිනට වයස | ස්ථිර පදිංචි ලිපිනය | තාවකාලික පදිංචි ලිපිනය | වර්තමාන නිත්‍ය සේවා ස්ථානය හා පදිංචි ලිපිනයේ සිට දුර | වර්තමාන නිත්‍ය සේවා ස්ථානයේ සේවා කාලය ( 2026.06.30 දිනට) - අනුයුක්ත කාල සීමා ඇත්නම් එම කාල සීමා හැර | විවාහක/ අවිවාහක බව | කලත්‍රයාගේ රැකියාව(රජයේ/ පෞද්ගලික/විදේශ/රැකියා නැති) | දරුවන් පිළිබඳ වස්තර(ආබාධිත නොවන) | | දරුවන් පිළිබඳ වස්තර(ආබාධිත ) | | නිලධාරියා හෝ යැපෙන්නන් යම් රෝගාබාධයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර | ආසන්නතම කාල සීමාව තුළ පූර්ව සේවා ස්ථාන 02 | | | | නිලධාරියා ඉල්ලුම් කර ඇති පාසල් හා පදිංචි ස්ථානයේ සිට ඇති දුර | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | වයස | ඉගෙනුම ලබන්නේ නම් පාසල | වයස | ඉගෙනුම ලබන්නේ නම් පාසල | | 1 | | 2 | | පාසල 01 හා දුර | පාසල 02 හා දුර | පාසල 03 හා දුර |
| | | | | | | | | | | | | | | | | | සේවා ස්ථානය | කාල සීමාව | සේවා ස්ථානය | කාල සීමාව | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |